# දැන්වීමයි

# දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂ වෛද්‍ය තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම - 2022 (2023)

01. දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් පූර්ණ කාලීන විශේෂ වෛද්‍ය තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2023.02.10 දිනවේ.

| තනතුර | තනතුරට අදාළ සංකේත අක්ෂරය | පුරප්පාඩු ගණන |
|---|---|---|
| සර්ප විෂ විශේෂ වෛද්‍ය තනතුර (පූර්ණ කාලීන) | A | 03 |
| අක්ෂි විශේෂ වෛද්‍ය තනතුර (පූර්ණ කාලීන) | B | 01 |
| කැඩුම් බිඳුම් විශේෂ වෛද්‍ය තනතුර (පූර්ණ කාලීන) | C | 01 |

02. මූලික සුදුසුකම් සපුරා ඇති ඉල්ලුම්කරුවන් ලිඛිත හා සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමට, විධි විධාන යොදනු ලැබේ. මෙම තනතුරු පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම පිළිබඳව අවසාන තීරණය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

03. සිංහල මාධ්‍යයෙන් පමණක් මෙම විභාගය පැවැත්වෙනු ඇත.

04. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-

(අ) අවම වශයෙන් සිංහල හත්වැන්න සමත් විය යුතුය. හින්දි/ සංස්කෘත/ ඉංග්‍රීසි භාෂා වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් පිළිබඳ දැනුමක් ඇති අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් පුරප්පාඩු පවතින තනතුරකට අදාළ ප්‍රතිකාර ක්‍රම සම්බන්ධයෙන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු විය යුතුය.

(ඇ) පූර්ව පළපුරුද්ද සමග ලියාපදිංචියෙන් පසුව වර්ෂ 03ක පළපුරුද්ද ලබා තිබිය යුතුය. නිෂ්පාදන හා අමු ඖෂධ හඳුනා ගැනීම සහ ඖෂධ නිෂ්පාදනය සම්බන්ධව ඇති පළපුරුද්ද පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) දකුණු පළාත තුළ ස්ථිර ලියාපදිංචිය සනාථ කිරීම සඳහා අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා දිනට පෙර අවුරුදු 06ක කාලයක් තුළ අනුගාමී වර්ෂ 03ක කාලයක් දකුණු පළාත තුළ අඛණ්ඩව ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

05. වයස් සීමාව :-

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 60ට නොවැඩි විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වයක් තිබිය යුතුය.

06. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) මෙහි පහත පළ කර ඇති ආකෘතිය අනුව ඒ 4 (සෙ.මී.21X29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත් 2023.02.10 දින හෝ ඊට පෙර ලැබෙනසේ, ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, 06 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂ වෛද්‍ය තනතුරු සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම - 2022(2023)"** යනුවෙන් සඳහන් කළ යුතුය. විභාගය පැවැත්වෙන දිනය හා ස්ථානය පසුව දන්වනු ලැබේ.

(ආ) විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකින්, ලංකා බැංකුවේ ගාල්ල කොටුව ශාඛාවේ ගිණුම් අංක 87262909 දරන ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත යන ජංගම ගිණුමට බැර කළ යුතු අතර, මුදල් තැන්පතු පත්‍රිකාවේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය හා මෙම විභාගයට අදාළ විභාග කේත අංකය වන OP21417 යන්න සඳහන් කළයුතු ය.

**උදා:-**

| | |
|---|---|
| **ගිණුම් අංකය** | - 87262909 |
| **ගිණුම් හිමියාගේ නම සහ ලිපිනය** | - ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත |
| **ජා.හැ.ප./ ගමන් බලපත්/ රියදුරු බලපත් අංකය** | - අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය |
| **දුරකථන අංකය** | - අයදුම්කරුගේ ජංගම දුරකථන අංකය |
| **තැන්පතුවේ අවශ්‍යතාවය** | - OP21417 |

මුදල් ගෙවූ රිසිට් පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උප තැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල්ද භාරගනු නොලැබේ.

(ඇ) අසම්පූර්ණ, අවිධිමත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, තැපැලේ දී වන නැතිවීම් හා ප්‍රමාද වීම් ගැන සලකා බලනු නොලැබේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් තනතුරට අදාළ විෂයය දැනුම පරීක්ෂා කිරීම සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂණයට භාජනය කොට තෝරා ගැනීම කරනු ලැබේ. (රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 15/90 හා 1990.03.09 හා දක්වෙන ප්‍රතිපත්ති වලට අනුකූලව පත් කරනු ලැබේ.)

08. විෂය නිර්දේශය : ලිඛිත පරීක්ෂණයකට පහත සඳහන් විෂයයන් ඇතුළත් වේ.

| | විෂයය | කාලය | ලකුණු |
|---|---|---|---|
| I. | ආයුර්වේදය පිළිබඳ සාමාන්‍ය දැනීම | පැය 01 | 100 |
| II. | විෂයයට අදාළ වූ ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 |

අපේක්ෂකයන් විසින් ඉහත සඳහන් විෂයයන් යටතේ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සපයනු ලැබිය යුතුය. මෙම ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂය සඳහා 40% හෝ ඊට වැඩි ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

09. දීමනා : දිනකට රු.2,500/- ක දීමනාවකට හිමිකම් ලැබේ.

10. සේවයෙහි නියුක්ත කරවීමේ කොන්දේසි :-

(අ) මෙම තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

(ආ) තෝරාගනු ලබන වෛද්‍යවරුන් දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ආයුර්වේද රෝහලක සේවය කළ යුතුය.

(ඇ) තෝරාගත් වෛද්‍යවරුන්ගේ සේවා කාලය වර්ෂයකට සීමා වේ. එම කාලය තුළ දී සේවය සතුටුදායක ලෙස ඉටු කළහොත් පමණක් තවත් එක් වර්ෂයකට සේවා කාලය දීර්ඝ කරන අතර, වර්ෂයෙන් වර්ෂයට සේවා කාලය දීර්ඝ කිරීම සලකා බලනු ලැබේ.

11. සේවා කොන්දේසි :

(අ) තෝරාගනු ලබන වෛද්‍යවරුන් හදිසි අවස්ථාවන්හි දී සේවයට කැඳවිය හැකිවන අතර, අදාළ රෝහල ආසන්නයේ පදිංචි විය යුතුය.

(ආ) තෝරාගත් වෛද්‍යවරුන් අදාළ ආයතන ප්‍රධානියා විසින් පනවනු ලබන කොන්දේසි වලට යටත්ව සේවය කළ යුතුය.

(ඇ) තෝරාගනු ලබන වෛද්‍යවරුන් රෝහලේ බාහිර මෙන්ම අභ්‍යන්තර රෝගීන්ට ද ප්‍රතිකාර කළ යුතුය.

(ඈ) සීමාවාසික පුහුණුව සඳහා අනුයුක්ත කරනු ලබන සියලුම ආධුනික වෛද්‍යවරුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කළ යුතුය.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**යූ.ජී. විදුර කාරියවසම්**
**ලේකම් (රා.ආ.),**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.**
**2023 ජනවාරි මස 17 දින.**